# කොවිඩ්-19 ව්‍යාප්තිය වළක්වමින් පොදු මහජන සහ වෘත්තිය ක්‍රියාකාරකම් සිදුකරන ආකාරය පිලිබඳව උපදෙස්

පොදු මහජන සහ වෘත්තීය ක්‍රියාකාරකම් සඳහා උපදේශ සටහන් ලබා දී ඇත. සංචාරක සේවා, විශාල සාප්පු සංකීර්ණ, උත්සව කළමනාකරණය වැනි සමහර අංශවලට උපදෙස් සටහන් කිහිපයක් අදාළ වේ.

මෙම උපදෙස් කාර්යයන් නැවත ආරම්භ කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ලබා දී ඇති සමස්ත අවසරයට යටත් වේ (මුළුමනින්ම / තෝරාගත්).

සෑම උපදෙස් සටහනක්ම සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශයේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරනු ලබයි. කොවිඩ්-19 සම්ප්‍රේෂණය වැළක්වීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග ආයතන හිමිකරු / වගකිවයුතු පුද්ගලයා වෙත ඉදිරිපත් කර ඇත.

වෘත්තීය ක්‍රියාකාරකම් සඳහා වැඩිදුර තොරතුරු ලබා ගැනීමට - කරුණාකර

http://eohfs.health.gov.lk/occupational/index.php?option=com_content&view=article&id=61&Itemid=208&lang=en වෙත යොමු වන්න.

නව ජීවන රටාවක් උදෙසා
புதிய வாழ்க்கை முறையை நோக்கி
TOWARDS A NEW NORMAL

සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය

World Health Organization Sri Lanka

රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටෙ මහ නගර සභාව

## 34.රජයේ අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු සහ වෙනත් රාජ්‍ය ආයතන

ආයතනයේ ප්‍රධානීන් සඳහා උපදෙස්

- ඔබේ අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකුට තම ආයතනයේ සෞඛ්‍ය ආරක්ෂාව පිළිබඳ සොයා බැලීමට පැවරීම සහ ඒ හා සබැඳි තොරතුරු ආයතන ප්‍රධානියාට වාර්තා කිරීමේ වගකීම පැවරීම.

- මුහුණු ආවරණ, ඇල්කොහොල් (alcohol) අඩංගු අත් පිරිසිදු කාරකය / සබන්; බිම / වැසිකිළි පිරිසිදු කිරීම සඳහා භාවිතා කරන විෂබීජ නාශක ප්‍රමාණවත් ලෙස සැපයීම සහතික කිරීම. ගොඩනැගිල්ලට බාහිර පුද්ගලයන් පැමිණෙන ස්ථානවල අත් සේදීම සඳහා පහසුකම් සකසන්න. සෑම ඒකකයකම 70% ඇල්කොහොල් අඩංගු අත් අත් පිරිසිදු කාරකය තබා තිබිය යුතුය.

- සපයන ලද පොදු මාර්ගෝපදේශයන්ට අනුව කාර්ය මණ්ඩලයේ නම් ලැයිස්තුවක් සකස් කර සෑම දිනකම පැමිණිය යුතු නිලධාරීන් පිළිබඳව කාර්ය මණ්ඩලය දැනුවත් කරන්න. (සීමාවන් තවදුරටත් ලිහිල් වන තෙක් මානව සම්පත්වලින් 50% ක් සමඟ ක්‍රියාත්මක වන්න).

- කොවිඩ් -19 වැළැක්වීමේ ක්‍රමෝපායන් අඛණ්ඩව පිළිපැදීමේ අවශ්‍යතාවය පිළිබඳව කාර්ය මණ්ඩලය සමඟ සාකච්ඡා කර ඔවුන් සඳහා සෞඛ්‍ය අධ්‍යාපන සැසියක් සංවිධානය කිරීම හා පැවැත්වීම. (මෙහිදී සේවාදායකයාට සේවා සැපයීමේදී අත් සේදීම, ශාරීරික දුරස්ථභාවය පවත්වා ගැනීම , ශ්වසන ආචාර විධි පිළිබඳව දැනුවත් කළ යුතුය.) මෙම සැසිය සංවිධානය කිරීම සඳහා උපදෙස් ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වෙතින් ලබා ගත හැක. මේ සඳහා සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශය මගින් නිපදවන ලද වීඩියෝ, ශ්‍රව්‍ය / දෘශ්‍ය මෙවලම් ද භාවිතා කළ හැකිය.

- ඉතා අතවශ්‍ය නම් මිස කණ්ඩායම් රැස්වීම් ගණන අඩු කරන්න. අවමය මීටර 1 ක වන ලෙස එකිනෙකා අතර දුරස්ථභාවයක් පවත්වා ගන්න.

- විෂබීජ නාශක සමඟ බිම / දොර හැඬල / මේස / විදුලි සෝපාන / පඩිපෙළ හා එහි ආධාරක පීලි ආදිය පිරිසිදු කිරීමේ වැදගත්කම පිළිබඳව දැනුම්දීම සඳහා සනීපාරක්ෂක සේවා සපයන්නන් වෙත රැස්වීමක් සංවිධානය කරන්න. (මේ සඳහා සේවා ස්ථාන වල කොවිඩ්-19 ව්‍යාප්තිය වැළැක්වීමට පෙර සූදානම සහ ප්‍රතිචාර දැක්වීම සඳහා වන මෙහෙයුම් මාර්ගෝපදේශය බලන්න).

- කාර්යාලයේ විවිධ අංශවලට පත් කර සිටින සෞඛ්‍ය ආරක්ෂක නිලධාරීහු ප්‍රමාණවත් මුහුණු ආවරණ තිබීම, කාර්යාලය පිරිසිදු කිරීමේ ක්‍රියාවලිය සහ කාර්ය මණ්ඩලයේ සෞඛ්‍ය මට්ටම අධීක්ෂණය කරනු ඇත. හදිසි අසනීප තත්ව සඳහා 1990 මගින් ගැළපෙන සෞඛ්‍ය පහසුකම් සහිත රෝහල් වෙත රෝගීන් ප්‍රවාහනය කරනු ඇත. ආසන්නම සෞඛ්‍ය පහසුකම් ඇති ස්ථාන වෙත ක්ෂණික ඇමතුම් (හොට්ලයින්) ලබා දීම මගින් රෝග ලක්ෂණ පිළිබඳ විස්තර ලබා ගත හැක (අංක දැනගත යුතුය).

- එක්තරා කාල සීමාවක් තුළ සේවාදායකයින් සීමිත පිරිසකට සේවා සපයන බව සහතික කිරීම සඳහා නිසි ක්‍රමවේදයක් සකස් කර ගත යුතු අතර එසේ සකස් කිරීමේදී සෞඛ්‍ය ආරක්ෂක කාර්ය මණ්ඩලය සහ අනෙකුත් කාර්ය මණ්ඩලය සමඟ සාකච්ඡා කළ යුතුය.

- විදුලි සෝපානයක් තිබේනම්, එහි පුද්ගලයින් සිටගත යුතු ආකාරය බිම සළකුණු කිරීම මගින්, විදුලි සෝපානය තුළ තදබදය ඇත්වීම වළක්වා ගත හැක.

- පළාත් හා ප්‍රාදේශීය මට්ටමේ කාර්ය මණ්ඩලය සමඟ සාකච්ඡා කර සැපයිය හැකි සේවාවන් සමහරක් විමධ්‍ය ගත කිරීම සඳහා කටයුතු කළ යුතුය. එමගින් ප්‍රධාන කාර්යාලයේ තදබදය වළක් වෙනු ඇත.

- අන්තර්ජාල / දුරකථන (දුරස්ථ) පද්ධති හරහා කාර්ය මණ්ඩලයේ සහ සේවාදායකයින්ගේ ගැටළු විසඳීම දිරිගැන්වීමේ ක්‍රම අනුගමනය කරන්න.

- සෞඛ්‍ය අධ්‍යාපන පෝස්ටර් / බැනර් ප්‍රදර්ශනය කිරීම සහ මහජන ඇමතුම් ක්‍රමයක් භාවිතා කර ශාරීරික දුරස්ථභාවය, දෑත් සනීපාරක්ෂාව සහ ශ්වසන ආචාර විධි පිළිබඳව ජනතාව නිතර දැනුවත් කිරීම.

- ආයතනයේ ස්ථාන සොයා ගැනීම පහසු කිරීමට සහ මිනිසුන්ගේ එක්රොක්වීම අඩු කිරීමට සේවාදායක උපදෙස් ප්‍රදර්ශනය කර පෙන්වන්න.

- ලබා දී ඇති උපදෙස් වලට අනුකූල බව දක්වමින් ඔබ විසින් එකහතා ප්‍රකාශය පිරවිය යුතුය. සම්පූර්ණ කරන ලද එකගතා ප්‍රකාශයේ මුල් පිටපත ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිවරයා වෙත යැවිය යුතුය. එහි පිටපතක් අදාළ පළාත් පාලන ආයතනයට (මහ නගර සභාව / නගර සභාව / ප්‍රාදේශීය සභාව) යැවිය යුතු අතර තවත් පිටපතක් තමන් සතුව තබා ගත යුතුය. ඉහත මාර්ගෝපදේශ දැඩි ලෙස පිළිපැදීම සහතික කිරීම ආයතන ප්‍රධානියාගේ වගකීම වේ.



සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.